2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

ලකුණු බෙදීයාම

- I කොටසේ ප්‍රශ්නය ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

1. ප්‍රශ්නය

(i) සිට (vii) දක්වා කොටස් වලට = ලකුණු 02 බැගින් 02 x 7= ලකුණු 14 යි

(viii) සහ (ix) කොටස් වලට = ලකුණු 04 බැගින් 04 x 2 = ලකුණු 08 යි

(x) කොටසට = ලකුණු 06 යි

I කොටසට නියමිත මුළු ලකුණු = ලකුණු 28 යි

II කොටස

ප්‍රශ්න අංක 1 සිට 6 වන ප්‍රශ්නය දක්වා

(i) වන කොටසට = ලකුණු 04 යි
(ii) වන කොටසට = ලකුණු 06 යි
(iii) වන කොටසට = ලකුණු 08 යි
ලකුණු 18 යි

ප්‍රශ්න අංක 7 සඳහා

(i) වන කොටසට = ලකුණු 08 යි
(ii) වන කොටසට = ලකුණු 10 යි
ලකුණු 18 යි

I වැනි කොටස සඳහා ලකුණු **28 යි**
II වැනි කොටස සඳහා ලකුණු **72 යි**

මුළු ලකුණු **100 යි**

Past Papers Wiki

ලකුණු දීමේ පටිපාටිය

I කොටස

1. (i)

- සීල සමාධි ප්‍රඥා යන ගුණවලින් යුතු අයෙකු වීම.
- තමාට වඩා ගුණ ධර්ම ඇත්තෙකු වීම.
- තමාට සමාන ගුණ ධර්ම ඇත්තෙකු වීම.

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 ක් සඳහා 01 x 2 = ලකුණු 02 යි)

(ii)

- ආහාර මතයක් නොවීම නිසා අලස බව හා උදාසීන බව නොවීම.
- රාත්‍රියට ආහාර සොයා යාමේ දුෂ්කර බව මඟ හැරීම.
- ආහාර පිළිබඳ ඇති තෘෂ්ණාව යටපත් වීම.
- සෞඛ්‍ය ගැටළු ඇති නොවීම.
- වැඩි කාලයක් භාවනාවේ යෙදීමට හැකි වීම.

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 ක් සඳහා 01 x 2 = ලකුණු 02 යි)

(iii)

(අ)	පසළොස්වක පොහොය	(ඉ)	පුර අටවක පොහොය
(ආ)	අමාවක පොහොය	(ඊ)	අව අටවක පොහොය

(ලකුණු ½ x 4 = ලකුණු 02)

(iv)

- කාම සේවනයෙන් තොර වීම.
- ස්ත්‍රී පුරුෂ සම්භෝගයෙන් තොරවීම.

මෙම කරුණු දෙකෙන් එක් කරුණක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(ලකුණු 02)

(v)

- මෛත්‍රී සහගත කාය කර්මයෙන්
- මෛත්‍රී සහගත වාක් කර්මයෙන්
- මෛත්‍රී සහගත මනෝ කර්මයෙන්
- මහණ බමුණන් සඳහා ගෙදොර විවෘතව තැබීමෙන්
- ආහාරපාන ආදිය පිළිගැන්වීමෙන්

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 ක් සඳහා 01 x 2 = ලකුණු 02 යි)

(vi)

- විමසා බලා කටයුතු කිරීම
- සතුරා හඳුනාගෙන දුරු කිරීම
- අනුගාමිකයන් රැක ගැනීම
- පිදිය යුත්තන් පිදීම
- නොපසුබට උත්සාහය
- උපායශීලී බව
-

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 ක් සඳහා 01 x 2 = ලකුණු 02 යි)

(vii)

- දැහැමි ධනෝපායන මාර්ගයක යෙදීම
- දැතෙහි වීර්යයෙන් දහඩිය වගුරුවමින් ක්‍රියා කිරීම (දැඩි උත්සාහයෙන් හා කැපවීමෙන් ක්‍රියා කිරීම)
- නුවණින් ක්‍රියා කිරීම
- සත්‍යවාදී වීම - අවංකව ක්‍රියා කිරීම
- සතුටින් ක්‍රියා කිරීම
- ප්‍රියශීලී අයෙකු වීම

මේ කරුණුවලට සමාන පිළිතුරු ඇත්නම් ලකුණු දෙන්න.

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 ක් සඳහා 01 x 2 = ලකුණු 02 යි)

(viii)

(අ). වඩුවෝ දැව නමති (එසේ) නුවණැත්තෝ තමා දමනය කර ගනිති.

(ලකුණු 02)

(ආ). සියල්ලෝ දඬුවමට නැතිගනිති. සියල්ලෝ මරණයට භය වෙති.

(ලකුණු 02)

(ix)

(අ). යථාපි භමරෝ පුප්ඵං - වණ්ණගන්ධං අහේඨයං
පලේති රසමාදය - එවං ගාමේ මුනීවරෙ

(ලකුණු 02)

(ආ). රමණීයානි අරඤ්ඤානි - යත්ථ න රමති ජනෝ
විත රාගා රමෙස්සන්ති - න තෙ කාමගවේසිනෝ

(ලකුණු 02)

PAST PAPERS WIKI

(x)

6

1

4

5

2

3

(ලකුණු 01 x 6 = ලකුණු 06)

(මුළු ලකුණු 28 යි)

II කොටස

01. (i)

- සංඝයාගේ යහපත
- සංඝයාගේ සුවපහසුව
- දුශ්ශීල පුද්ගලයන්ට නිග්‍රහ කිරීම
- සීලය ප්‍රිය කරන භික්ෂූන්ගේ යහපත
- මේ ජීවිතයේ පැමිණෙන දුක් නැති කිරීම
- පරලොව දී පැමිණෙන දුක් නැති කිරීම
- නොපැහැදුන අයගේ පැහැදීම
- පැහැදුන අයගේ ප්‍රසාදය වැඩිවීම
- සද්ධර්මයේ විර පැවැත්ම
- විනය සඳහා රුකුළක් වීම

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 4 ක් සඳහා 01 x 4 = ලකුණු 04 යි)

(ii)

- සංඝාදිසේසාපත්තියට පත් වූ භික්ෂුව පළමුව වරද පිළිගෙන ආයති සංවරයෙහි පිහිටිය යුතු ය.
- අනතුරුව පරිවාස - මානත් - අබ්භාන යන විනය කර්ම තුන කරවා ගත යුතු ය.
- ආරම්භයේ සිටම අවසානය දක්වා ඇති සියළුම කාර්යයන් සංඝයා වෙතින්ම කරවාගෙන මෙම ඇවතින් පිරිසිදු විය හැකිය.

ඉහත කරුණු ඇතුළත් පිළිතුරට ලකුණු ප්‍රදානය කරන්න. **(ලකුණු 06)**

(iii)

- විනය යනු ශික්ෂණයයි.
- එම ශික්ෂණයේ අරමුණ විමුක්තියයි.
- එසේම භික්ෂුව විනයානුකූලව ශික්ෂණයෙන් ක්‍රියා කිරීම නිසා ජනතා ප්‍රසාදය ඇති වේ.
- එය ශාසනයේ පැවැත්මට හේතු වේ.
- කවදත් ඇතැම් භික්ෂූන් විනය විරෝධීව හැසිරෙන අතර එමඟින් ශාසනයේ පැවැත්මට බාධා ඇති වේ.

මෙම කරුණු ද සමඟ විස්තර ලියා ඇති පිළිතුරට ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 08)

02. (i)

- සත්වයාගේ ගතිය හා නිවණ දත් බැවින් බුද්ධ නම් වේ.
- විදර්ශනා ඥානය සහ ප්‍රතිපත්ති ධර්ම දත්ත.
- කෙලෙස් දුරු කළහ.
- පස් මරුන් දිනූහ.
- දමනය කිරීමට දුෂ්කර වූවෝද දමනය කළහ.
- සියුම් වූ සැප ලබා දෙන්නා වූ දහමක්ම දේශනා කළහ.

(නිවැරදි එක් කරුණකට ලකුණු 02 බැගින් කරුණු 2 ක් සඳහා 02 x 2 = ලකුණු 04 යි)

(ii)

- නොකල්හි පිඬු පිණිස නොහැසිරීම
- පංච කාමයන් පිළිබඳ ඇල්ම දුරු කිරීම
- ස්ත්‍රී ලක්ෂණය මෙනෙහි කිරීම
- ධර්මයෙන් උපකාර කිරීම
- බොරු නොකීම
- අනුන්ට අපවාද නොකිරීම
- සමාධියෙන් ගත කිරීම
- සිව්පසය ප්‍රත්‍යවේක්ෂා කොට වැළඳීම.

(නිවැරදි එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 3 ක් සඳහා 01 x 3 = ලකුණු 03 යි)
(එම කරුණු අගය කර ඇත්නම් ලකුණු 01 බැගින් කරුණු 03ක් සඳහා 01 x 3 = ලකුණු 03)

(iii)

- ගිහි බෞද්ධයාගේ නිත්‍ය සීලය පංච ශීලයයි.
- ඔහු පොහෝ දින පෙහෙවස් සමාදන් වේ.
- පංසිල් තමාටත් අනෙකාටත් යහපත පිණිස හේතුවන ආචාර ධර්ම පද්ධතියකි.
- ආසාව දුරු කිරීමට ශික්ෂණයක් පෝය දින පෙහෙවස් සමාදන් වීමෙන් ලැබේ.

ගිහිවත අගය කරමින් ලියා ඇති පිළිතුරට ලකුණු ප්‍රදානය කරන්න. (ලකුණු 08)

03. (i)

යහපත් ජීවිතයක් ගොඩනඟා ගැනීමට අවශ්‍ය ධර්ම කරුණු ඇතුළත් ධම්මපද ගාථාවක් නිවැරදිව ලියා ඇති පිළිතුරට ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 04)

(ii)

ගාථාවෙහි අදහස නිවැරදිව දක්වා ඇත්නම් ලකුණු 03 ක් ද, අර්ථවත් ජීවිතයක් ගොඩනඟා ගැනීමට එම ධර්ම කරුණු උපකාර වන අයුරු විස්තර කොට ඇති පිළිතුරට ලකුණු 03 ක් ද බැගින් ලකුණු 06ක් ප්‍රදානය කරන්න.

(ලකුණු 06)

Past Papers Wiki

(iii) ධම්ම පදයේ ඇතුළත් ගාථා දේශනා කොට ඇත්තේ කිසියම් සිද්ධියක් මූල් කොටගෙනය. එම සිද්ධිය තේරුම් ගත් විට අදාළ ගාථාවෙන් කියැවෙන ධර්ම කරුණු වටහා ගැනීම පහසු වේ.

නිදාන කථා දෙකක්වත් දක්වා විස්තර කරන පිළිතුරට ලකුණු ප්‍රදානය කරන්න. (ලකුණු 08)

එක නිදාන කථාවක් දක්වා ඇත්නම් ලකුණු 04ක් ප්‍රදානය කරන්න.

04. (i)

- චරිතවත් බව
- දැන උගත් බව
- කාරුණික බව
- ආදර්ශමත් බව
- අවංක බව
- සංවර බව
- වාම් බව

(ගුරුවරයෙකු සතු මෙබඳු ගුණාංග හතරක් දක්වා ඇත්නම් එක් කරුණකට ලකුණු 01 බැගින් 01 x 4 = ලකුණු 04)

(ii)

ගුරුවරයාට ශිෂ්‍යයා විසින් දැක්විය යුතු යුතුකම් හා ආචාර විධි විනය පිටකයේ දැක්වෙන්නේ ආරාමික ජීවිතයට අදාළවයි.

- ශිෂ්‍ය භික්ෂුව ගුරු හිමියන්ට අවධි වූ තැන් පටන් නින්දට යන තුරු කළ යුතු ආචාර විධි එහි දැක්වේ.
- ගුරුවරයාට පරිභෝජනයට අවශ්‍ය දේ සපයා දීම සහ පිරිසිදුව තබා ගැනීම
- පැවිදි ජීවිතය ආරක්ෂා කර ගැනීමට උපකාර කිරීම

ගිහි විනයෙහි ගුරුවරයාට කළ යුතු යුතුකම් සිඟාලෝවාද සූත්‍රයෙහි දැක්වේ.

- දැක හුනස්නෙන් නැගිටීම
- උපස්ථාන කිරීම
- ගුරුවරයාගේ වචනවලට කීකරු වීම
- වත් පිළිවෙත් කිරීම
- මනාව ශිල්ප ඉගෙනීම

(මෙම කරුණු අතුරින් කරුණු තුනක්වත් දක්වා ඇත්නම් එක් කරුණකට ලකුණු 02 බැගින් 02 x 3 = ලකුණු 06)

භික්ෂු විනය නැතහොත් ගිහි විනය දක්වා පිළිතුරු ලියා තිබිය යුතු වේ.

(iii)

ගුරුවරයාගේ කාර්යයන් වගකීමෙන් ඉටු කිරීමත්, ශිෂ්‍යයා ආචාර ධර්ම පිළිපදිමින් ගුරුවරයාගේ සිත් ගෙන මැනැවින් අධ්‍යාපනය ලැබීමත් නිර්මාණශීලී විනය ගරුක සමාජයක් බිහි වී පැවිදි හෝ ගිහි සමාජය ස්ථාවර වන හැටි පෙන්වා ලියා ඇති සාථර්ක පිළිතුරට ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 08)

Past Papers Wiki

05. (i)

- වඳුරා තමා කුඩා කල බිම සිට නුග දල්ල කෑ බවයි.
- ඇතා ප්‍රකාශ කලේ එම නුග පැලය තමාගේ නාබියෙහි ගෑවුන බවයි.
- එවිට වටුවා කීවේ වෙනත් නුග ගසක ගෙඩි කා තමා දැමූ වසුරු නිසා මෙම නුග ගස හටගත් බවයි.

(මෙසේ වටුවා තමා වැඩිහිටියා බව ඔප්පු කළ හැටි දක්වා ඇති පිළිතුරට ලකුණු ප්‍රදානය කරන්න.)

(ලකුණු 04)

(ii)

- භික්ෂු සාසනයෙහි වැඩිමහළු පිළිවෙල ගණන් ගන්නේ පැවිදි වූ දින සිට හෝ උපදම්පදා වූ දිනයේ සිටය.
- එම වැඩමහලු පිළිවෙල අනුව හුනස්නෙන් නැගී සිටීම, ගරු බුහුමන් දැක්වීම, මුල්ම අසුන, මුල්ම ආහාර පාන ලැබීම සිදු කළ යුතු ය.
- එසේ නොමැතිව ධ්‍යාන මාර්ග ලැබුවත් දැන උගත්කම් ඇතත් වැඩිමහළු පිළිවෙල ඉක්මවිය නොහැකිය.

(ලකුණු 06)

(iii)

පසුව පැමිණි තෙරවරු සෙනසුන් නොලබති. සැරියුත් තෙරුන් වහනසේගේ අතවැස්සෝ ද තෙරුන් වහන්සේට සෙනසුනක් සොයන්නේ නොලැබුහ. තෙරුන් වහන්සේ සෙනසුනක් නොලබන්නේ ශාස්තෘන් වහන්සේගේ සෙනසුනට නුදුරෙහි එක් ගසක් මූල හිඳිමින් ද සක්මනේ ද කල් ගෙවූහ. ශාස්තෘන් වහන්සේ අලුයම නික්ම කැරුහ. තෙරුන් වහන්සේ ද කැරුහ. ඒ කවරෙක් ද? ස්වාමීනි මම සාරිපුත්ත වෙමි.

(ලකුණු 08)

06. (i)

- දෙවිදත් ගලක් පෙරලීමෙන් බුදුරදුන්ගේ පය ගල් පතුරකින් තුවාල විය.
- මෙය දැනගත් බොහෝ භික්ෂූහු බුදුරදුන් දැකීමට පැමිණියහ.
- පැමිණි භික්ෂූ පිරිස විශාල වූ බැවින් ඉඩකඩ ඇති මද්දකුච්ඡියට බුදුරදජාණන් වහන්සේ වැඩමවූහ.
- එහි දී භික්ෂූන් වහන්සේ දෙවිදත් හා ඔහු පිරිවරා සිටින පිරිස පාපීන් බව ප්‍රකාශ කළ විට බුදුරජාණන් වහන්සේ මේ ජාතක කථාව දේශනා කළහ.

(මෙම විස්තර ඇතොත් ලකුණු ප්‍රදානය කරන්න) **(ලකුණු 04)**

(ii)

සොරුන් අතර වැඩුනු සත්තිගුම්බ ගිරවා සොරුන්ගේ ගතිගුණ ඇති අයෙකු වූ සැටින්, තවුසන් අතර වැඩුන පුෂ්පක ගිරවා තවුසන් තුළ වූ යහපත් ගුණ ධර්ම පුරුදු වූ හැටින් පෙන්වා දී එකම මව් පියන් ගේ පැටවුන් වූ නමුත් පරිසරය අනුව ගිරවුන් දෙදෙනා වෙනස් වූ හැටි දක්වා ඇති පිළිතුරට ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 06)

PAST PAPERS WIKI

(iii)

පෙර උත්තර පඤ්චාල නුවර පඤ්චාල නම් රජ කෙනෙක් රාජ්‍ය කරවයි. මහසත් මහ වනයෙහි එක් කඳු රැලියක ඉඹුල් වනයෙහි එක් ගිරා රජෙකුට පුත්ව උපන්නේය. සෙහොයුරෝ දෙදෙනෙක් වූහ. ඒ කඳු මුදුනේ උඩු සුළඟ පැත්තට සොරුන් පන්සියයකට ගෙවල් ඇති සොරුන්ගේ ගම විය. යටි සුළඟ පැත්තට තවුසන් පන්සියයක නිවාස විය.

(ලකුණු 08)

07. (i)

(අ) තරුණියෝ පියුම් රැස් කිරීමට නදියට ගියාහුය.
(ආ) මව විහාරයට ගොස් ධර්මය අසා දන් දෙයි.
(ඉ) භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ සමීපයට පැමිණ වැඳ එකත් පසෙක හුන්හ.
(ඊ) ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් මෙසේ කීවේ ය.

(ලකුණු 02 x 4 = ලකුණු 08)

(ii)

(අ) අහං බුද්ධං ච ධම්මං ධ සංඝං ච සරණං ගච්ඡාමි.
(ආ) මාතා හන්තං පවිත්වා බාලකානං දෙති.
(ඉ) මයං සබ්බං චෙතියං වන්දාම.
(ඊ) ඒකං සමයං භගවා ජෙතවනෙ විහරි
(උ) භික්ඛූ ගාම වාසීනං ධම්මං දෙසිස්සති.

(ලකුණු 02 x 5 = ලකුණු 10)

(මුළු ලකුණු 72 යි)

****

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library